## බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාව

## හෙලමුදුන, බණ්ඩාරවෙල

0572222517

bawelaprasa@gmail.com

www.bandarawelaps.gov.lk



එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ හා යුරෝපා සංගමයේ අනුග්‍රහයෙනි.

Funded by European Union

UNDP

STRIDE CDLG Capacity Development of Local Governments


# බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාව

## ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත, ප්‍රසිද්ධ රඟ දැක්වීමක් හෝ සැණකෙළියක් පැවැත්වීමට පෙර ඔබ අනුගමනය කළ යුතු වැඩපිළිවෙළ.


www.bandarawelaps.gov.lk

## ඉදිරිපත් කළ යුතු ලේඛන

- පෙරටු කාර්යාලයෙන් හෝ අන්තර්ජාලයෙන් ලබා ගෙන නිවැරදිව සම්පූර්ණ කළ ඉල්ලුම් පත්‍රය;
- A 4 ප්‍රමාණයේ කඩදාසියක අඳින ලද, සැණකෙළියේ කාර්යයට යොදා ගන්නා සෑම අංගයක් ම පෙන්නුම් කරන සැණකෙළි භූමියේ දළ රූප සටහනක්;
- ඒ ස්ථානයට රැස් වන මහජනතාවට ප්‍රමාණවත් වැසිකිළි පහසුකම් (ස්ත්‍රී, පුරුෂ සහ ආබාධිත අයට වෙන වෙනම) සපයනු ලබන බවට තහවුරු කරන ලිපියක්;
- ඒ ස්ථානයේ ඉදි කර ඇති තාවකාලික ගොඩනැගිලි ප්‍රමාණවත් සවි ශක්තියකින් යුක්ත වන බවට ඉංජිනේරුවරයකු විසින් නිකුත් කළ සහතිකයක්;
- ඒ යම් ගොඩනැගිල්ලක රැස් වන මහජනතාවට දූෂණයට ලක් නොවූ හා ප්‍රමාණවත් වාතාශ්‍රය පවතින බවට සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි විසින් නිකුත් කළ සහතිකයක්;
- ආපදා අවස්ථාවක දී, රැස් වී සිටින ජනතාව ඉතා කෙටි කාලයක් ඇතුළත ඉන් ඉවත් කිරීමට ප්‍රමාණවත් පිටවීමේ දොරටු සහ ආරක්ෂිත වැඩ පිළිවෙළ යොදා ඇති බවට සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි විසින් නිකුත් කළ සහතිකයක්;
- හදිසි ගිනි ගැනීමක දී යොදා ගත හැකි පරිදි ප්‍රමාණවත් ගිනි නිවීම් උපකරණ (සාමාන්‍ය ගිනි නිවීම්, විදුලි ගිනි නිවීම් සහ ඉන්ධන ගිනි නිවීම් උපකරණ) යොදා ගනු ලබන බව තහවුරු කරන ලිපියක්;
- සැණකෙළි භූමිය තුළ සාමය පවත්වා ගෙන යාමට අවශ්‍ය වැඩ පිළිවෙළ යොදා ඇති බවට ප්‍රදේශයේ පොලිස් ස්ථානාධිපති විසින් නිකුත් කරන ලද

## ගෙවිය යුතු ගාස්තු:

- ඉල්ලුම් පත්‍ර ගාස්තුව රු. 150.00 (අන්තර්ජාලයෙන් ලබා ගත් ඉල්ලුම් පත්‍රයක් වන විට ගාස්තු අය නොකෙරේ);
- බලපත්‍ර ගාස්තුවට සරිලන රජය නියම කළ බදු.

## කාර්යයට සම්බන්ධ වන නිලධාරීන්


පෙරටු කාර්යාල නිලධාරියා:

දුරකථන අංකය: 02 . 0572222517

විද්‍යුත් තැපැල: bawelaprasa@gmail.com

තාක්ෂණ නිලධාරි:

දුරකථන අංකය: 02 . 0572222517

විද්‍යුත් තැපැල: bawelaprasa@gmail.com


## ඔබගේ කාර්යය නිම කිරීමට අපට අවශ්‍ය කාලය: දින 5

## විශේෂ කරුණු:

මෙම රඟ දැක්වීමට හෝ සැණකෙළියට ප්‍රේක්ෂකයන් ඇතුළත් කර ගැනීම සඳහා ගාස්තු අය කරනු ලබන්නේ නම්, ඒ අය කරන ගාස්තුවෙන් 1% ක ප්‍රතිශතයට සමාන වටිනාකමක් විනෝද බද්ද වශයෙන් ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු ය.